# සසර වසන තුරු
## – මට වාසනාවන්

වැව දගැබ කුඹුර ගම හා මුසුව හැදී
අපරාදීන ජාතියකට පොහොර දිදී
දෙදහස් වසකටත් වැඩි ගොවි කමින් රැදී
ඉන්දිය සයුරෙ මුතු ඇටයට කරමි ලැදී

මහවැලි කැළණි වලවේ ගං හතර අතින්
දිවයින පුරා කෙත්වතු සරු සාර කරන්
උතුරා ගලනවිට ගොවිජන සිතැඟි තුලින්
ගොවිරජ දහන බැබලෙයි වාසනා වකින්

රන්වන් කරල් බර උන කෙත සතුට ගලයි
උඩරට වගාවන එළවලු සිරුර වඩයි
වයඹින් ගලන මීපැණි ගඟ ලෙයට හැරෙයි
ලෝකෙන් උතුම් රට මා දිනු ලංකා වයි

පොළොන්නරුව, සීගිරි, අනුරා පුරය
යටගිය අතීතය පිළිබඳ රස වැකිය
ගල්ඔය වලවෙ මාදුරු ඔය මාවැලිය
වත්මන් හෙළයො නැගූ ජයමාවත් වැනිය

මඩ සෝදා රැගත් ගොවියා රජකම ට
පත්වන වග පෙනෙයි අද මේ අප ඇස ට
අනාගතයෙ මෙහි ඉපැදෙන පරපුර ට
දායාදයන් වෙනු ඇත මේවා පෙර ට

ජාතික ජීව රුධිරය හෙළ බිමෙහි පුදා
ගොවිතැන වෙතට යොමුකර සහලින් සැමදා
ස්වං පෝෂණය ලැබ රන්මසු රටට බෙදා
සෙත සලසන්න පෙරමුණ ගනු මැනවි මෙදා

හැම සම්පතින් පිරි බිම් අහලක් ගානෙන්
රන්මුතු මතුවෙනා ගොවිජන දා බිඳුවෙන්
දකිනාතුරු නිවන් සිරිලක නිජ බිම මෙන්
සසර වසන තුරු මට වාසනා වන්

එප්පාවල කෘෂිකර්ම උපදේශක
**ජේ. බී. සමරකෝන් විසිනි**